## තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් ආලෝකය ලබමු!

මානව ශිෂ්ටාචාරයෙහි ''යුග'' ගණනාවක් ගෙවී ගොස් නව යුග උදාවීම හැමදාමත් සිදුවුනි. එදා වසර සිය-දහස් ගණනක් එක දිගට පැවති ''යුගයක්'' දැන් උදා නොවන තරම්ය. මෑත කාලීන බොහෝ යුග පැවතුනේ ටික කාලයකි. ඇත්ත වශයෙන්ම කිවහොත් ''යුග'' අතිච්ඡාදනය - එක මත්තේ එක පතිතවන ''යුගයක'' අපි සිටින්නෙමු.

දැන් අප පසුකරමින් සිටින මේ යුගය බොහෝ අය හඳුන්වන්නේ ''තොරතුරු සන්නිවේදන තාක්ෂණ'' යුගය ලෙසය. ශ්‍රී ලංකාවේ අපව මෙම නව යුගයේ ''දැළට'' කොතරම් ඉක්මනින් හසුවූයේ ද යත්, ''ලූප්'' නොමැති කමින් දුරකථනයක් ලබා ගත නොහැකිවූ, රූපවාහිනිය-පරිගණකය ඇසුර නොලැබූ, විදෙස් රටකට හිතමිතුරෙකු ඇමතීමට පෙරුම් පිරීමට සිදුවූ, අන්තර්-ජාලය, විශ්ව විසිරි වියමන, ඉ-තැපැල සිහිනයකවත් නොතිබූ යුගය අපට දැන් මතක නැති තරම්ය. ඒ තොරතුරු තාක්ෂණය හැම දෙසින්ම ඉතා වේගයෙන් අප වෙලාගෙන ඇති හෙයිනි.

''දැන ගියොත් කතරගම-නොදැන ගියොත් අතරමග'' යන කියමන මේ මොහොතේ තොල් අතර පෙරළි කරනුයේ තොරතුරු තාක්ෂණයේද හපන්කම්, පුරසාරම් මෙන්ම මෝඩකම්වලින්ද යුක්ත බව පෙනෙන හෙයිනි.

එසේ වුවද, රබර් මංඩියක ඇවිදින විට කුඩැල්ලන්ගෙන් බේරිය නොහැකි තරමටම අද අපට තොරතුරු සන්නිවේද තාක්ෂණයෙන් ගැලවීමක් ද නැත. එනමුදු තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් දුරස්වීම අවශ්‍ය නොවේ. කළ යුතුව ඇත්තේ නැණ-නුවනැස යොදාගෙන එය පරිශීලනය කිරීමය.

දිවයින පුරා දිනෙන් දින විවෘත වන 'නැණ සල', 'විදාතා' මධ්‍යස්ථාන, පෞද්ගලික අංශයේ තොරතුරු තාක්ෂණ සල් ද මෙරට සංවර්ධනයට දායක වනු දැක්ම අපගේ අපේක්ෂාවය. එහෙයින් හෙට දවසේ මේ රටේ උරුමක්කාරයන් වන ඔබ සැම-සිසු පරපුර-දැස් විවර කළ යුත්තේ මේ නව රිවිකිරණ ඔබගේ දිවිමංපෙත ඒකාලෝක කරන්නාවූ උදෑසනකය.

- තුසිත මලලසේකර